**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව -2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි.2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂවල ලද ප්‍රාග්ධන ප්‍රදානවලට අදාල වාර්ෂික ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ ආදායමට හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ලද රු.9,814,127 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දැක්වීම වෙනුවට අතිරික්තයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස දක්වා තිබුණි. | -එම- | අවසන් ගිණුම් සකස් කිරිමේදී නිවැරදි අගයන් අදාල කර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 134(1) වගන්තිය | 2010 වර්ෂයෙන් පසු නව දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කර වරිපනම් බදු අයකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii)154 වගන්තිය | සභා බල ප්‍රදේශය තුල වෙන්දේසි කර විකුණනු ලබන ඉඩම්වල විකුණුම් වටිනාකමින් සියයට 01 ක බද්දක් සභාව විසින් අයකළ යුතු වුවත්, එයට පටහැනිව ඉඩම්වල තක්සේරු වටිනාකම පදනම් කර ගෙන බදු අය කර තිබුණි. | පිළිගන්නා බව.සත්‍ය විකුණුම් මිල මත පදනම්ව 01% බදු මුදල් අයකර ගැනීම සඳහා දැනුවත් කිරීම් සිදු කර ඇත. ඉඩම් වෙන්දේසි ආයතන කොටස් වශයෙන් ගෙවීමේ පදනම මත අලෙවි කරන බැවින් 01% බදු අය කිරීමේදී ප්‍රායෝගික ගැටළු පවතින බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii)158(අ) වගන්තිය | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් මේ දක්වා කර නොතිබුණි. | පිළිගන්නා බව. 2022 වර්ෂයේ රටේ පැවති ආර්ථික අර්බුද හේතුවෙන් එලෙස සිදු නොකරන ලදි. මේ වන විට ලිඛිතව දැනුවත් කර ඇති අතර 2023.06.30 න් පසු දේපළ තහනම් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.68,792,224 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.52,741,814 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,686,200 | 7,594,881 | 6,663,491 | 931,390 | 6,880,860 | 6,865,705 | 5,379,839 | 1,485,865 |
| (ii) | කුලී | 9,818,600 | 5,628,435 | 4,504,119 | 1,124,316 | 10,005,150 | 5,165,464 | 2,728,864 | 2,436,599 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 380,000 | 356,000 | 356,000 | - | 413,000 | 413,000 | 413,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 112,563,300 | 38,691,300 | 17,883,032 | 20,808,268 | 112,138,960 | 8,869,020 | 118,729,212 | 2,278,768 |
| | | 129,448,100 | 52,270,616 | 29,406,642 | 22,863,974 | 129,437,970 | 21,313,189 | 127,250,915 | 6,201,232 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල හඳුනාගත් වරිපනම් ඒකක සංඛ්‍යාව 6,916 ක් වුවත්, ඉන් ඒකක 4,748 කින් පමණක් වරිපනම් අයකර තිබූ අතර ඒකක 2,168 කින් වරිපනම් අය කිරිම සඳහා කටයුතු කර නොතිබුණි. | 2023.05.31 දිනට හිඟ වරිපනම් ඒකකවලින් ඒකක 495 ක වරිපනම් අය කර ඇත. තව දුරටත් ඒකක 1,673 ක් අයකළ යුතුව ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ මාර්ග 04 ක් ඉදි කිරිම සඳහා හදිසි මිලදී ගැනීම් ලෙස වටිනාකම රු.195,000 ක ABC කියුබ් 10 ක් මිලදී ගැනීම් පිළිබද ලේඛන මගින් තහවුරු නොවුණි. | මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම අනුව කරීන පිංකම් කිහිපයක් ගමන් ගන්නා මාර්ග සංවර්ධනය සඳහා මිලදී ගත් ABC භාවිත කළ බව. | මිලදී ගනු ලබන ද්‍රව්‍ය විධිමත් පරිදි ලේඛනගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අමුද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර නඩත්තු කළ යුතු මාර්ග පිලිබඳ සැලැස්මක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය තුළ රු.2,851,200 ක් වූ කෝලාස් බැරල් 80 ක් සහ රු.780,000 ක් වූ චිප්ගල් කියුබ් 40 ක් මිලදී ගෙන තිබුණි. | සභා අනුමැතිය ලබාගෙන ජල සම්පාදන මණ්ඩලය විසින් ජල නල එලීම සඳහා පළුඳු කළ මාර්ග කොරෝනා නිසා අළුත්වැඩියාවට ප්‍රමාද විය. උපකාර්යාල විසින් ලබාදී ඇති මාර්ග විස්තර අනුව මාර්ග යථා තත්ත්වයට පත් කළ අතර ඉදිරියේදී සැලසුමකට අනුව කටයුතු කරන බව | අළුත්වැඩියා කළ යුතු මාර්ග හඳුනාගෙන සැලසුමකට අනුව මිලදී ගැණුම් කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කොටස් කර වෙන්දේසි කරන ලද ඉඩම්වල වෙන් කරන ලද මාර්ග ප්‍රමාණය ගණනය කර මාර්ග ලේඛනයට ඇතුලත් කර නොතිබුණු අතර 2018 වර්ෂයෙන් පසු මාර්ග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | දැනට මාර්ග මිණුම්ගත කරමින් මාර්ග ලේඛනය යාවත්කාලීන කරමින් පවතින බව | මාර්ග ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) 1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිඳු සුසානභූමියක වැට මායිම් සකස් කර නොතිබුණු අතර සුසානභූමි 25 ක හිමිකමද සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | මෙම ඉඩම්වල අයිතිය ප්‍රාදේශිය ලේකම් සතු බැවින් එම ඉඩම් විධිමත්ව පවරා දෙන තෙක් ආරක්ෂිත වැට මායිම් සළකුණු කළ නොහැකි බව | ඉඩම්වල අයිතිය පවරාගෙන ආරක්ෂිත වැටමායිම් සකස් කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිල ගණන් කැඳවීමට පෙර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මිලදී ගැනීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කරවාගෙන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමකින් තොරව වායු සමීකරණ 04 ක් රු.977,497 කට මිලදී ගෙන තිබුණි. | පිළිගනිමි. සේවයේ අවශ්‍යතාවය මත මිලට ගෙන ඇත. ඉදිරියේදී නිවැරදි ක්‍රමවේදයකට අනුව කටයුතු කරන බව | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැණුම් කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය, සේවය හැරගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ සේවකයින් 11 දෙනෙකුගෙන් අය විය යුතුව තිබූ රු.845,590 ක ණය ශේෂය 2023 මැයි 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | විශ්‍රාම ගන්වන ලද නිලධාරිනියකගෙන් අයවිය යුතු මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර මියගිය හා සේවය හැරගිය අය වෙත ලිපි මගින් 2023 වසරේ දැනුවත් කර ඇති බව. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ එකතු වන කසළ පෞද්ගලික ආයතනයට ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.7,842,000 දරා තිබූ අතර කසළ අංගනයක් ප්‍රතිස්ථාපනය කොට කොම්පොස්ට් නිෂ්පාදනය කිරිමට එකතු වන කසළ බැහැර කිරිමට යන වියදම අඩු කර ගැනීම කෙරෙහි සභාව අවධානය යොමු කර නොතිබුණි. | 2018 දී මිල්ලනිය ප්‍රාදේශීය සභාව ආරම්භ කිරීමේදී කසළ අංගනය මිල්ලනිය ප්‍රාදේශීය සභාවට හිමි විය. මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් කසළ ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා බාහිර ආයතනයකට කසළ ලබා දෙන ලදි. දැනට මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් දිරන කසළ ටොන් ¾ ක් ලබා ගැනීමට එකඟ වී ඇත. ඉතිරි කසළ බාහිර ආයතනයකට ලබා දෙන බව. | ගෘහස්ථ කොම්පොස්ට් බඳුන් ආදිය ලබාදී දිරන කසළ රැස් කිරීම අවම කිරීමටත් එකතුවන කසළ කොම්පොස්ට් නිෂ්පාදනයටත් යෙදවීමට අවධානය යොමු කළ යුතුය. |